# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 12,073—1960 මාර්තු 4 වැනි සිකුරාදා—4.3.1960**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# II කොටස–අධිකරණ

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබාගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට | | | පිට |
| --- | --- | --- | --- | --- |
| සම්මත වූ පණත් ... ... ... | — | පිස්කල් විකිණීම් ... ... | — | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන | 5 | මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... | — | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම් ... | — | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... | ... | — |
| වස්තුභංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — | නොතාරිස් ලැයිස්තුව ... | ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන් පත් කිරීම් ... ... | — | විවිධ දැන්වීම් ... ... | — | — |


## ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන

### ප්‍රකාශනයයි

ශ්‍රී ලංකාවීපයේ ගරු ශ්‍රේෂ්ඨාධිකරණයෙන් මට ලැබී තිබෙන අධිකරණ විධානයක බලය පිට මධ්‍යම කොට්ඨාශය සඳහා එකී අධිකරණයේ අපරාධ නඩු වාරයක් වර්ෂ 1960ක් වූ මාර්තු මස 10 වන දින පෙරවරු 11ට බණ්ඩාරවෙල අධිකරණ ශාලාවේදී පවත්වන්නට යෙදෙන බව මම මෙයින් ප්‍රකාශ කර සිටිමි.

තව ද, ඉහත කී වේලාවට එකී ස්ථානයට පැමිණ සිටින ලෙසත්, අවසර ඉල්ලා ලබාගෙන මිස එතැනින් පිටවී නොයන ලෙසත්, මේ නඩු වාරය හා සම්බන්ධකමක් ඇති සියලු දෙනාට ම මම මෙයින් නියම කොට දැනුම් දෙමි.

බී. පී. වී. ඒ. ජේ. පී. සේනාරත්න,
ඌව දිශාවේ පිස්කල්.

වර්ෂ 1960ක් වූ පෙබරවාරි මස 26 වන දින,
බදුල්ලේ පිස්කල් කන්තෝරුවේදීය.

### ප්‍රකාශනයයි

ශ්‍රී ලංකාද්වීපයේ ගරු ශ්‍රේෂ්ඨාධිකරණයෙන් මට ලැබී තිබෙන අධිකරණ විධානයක බලය පිට උතුරු මධ්‍යම පළාත සඳහා එකී අධිකරණයේ අපරාධ නඩු වාරයක් වර්ෂ 1960ක් වූ මාර්තු මස 10 වන දින පෙරවරු 11 ට අනුරාධපුර පිහිටි අධිකරණ ශාලාවේ දී පවත්වන්නට යෙදෙන බව මම මෙයින් ප්‍රකාශ කර සිටිමි.

තව ද, ඉහත කී වේලාවට එකී ස්ථානයට පැමිණ සිටින ලෙසත්, අවසර ඉල්ලා ලබාගෙන මිස එතැනින් පිටවී නොයන ලෙසත්, මේ නඩු වාරය හා සම්බන්ධකමක් ඇති සියලු දෙනාට ම මම මෙයින් නියමකොට දැනුම් දෙමි.

ඇන්. පී. විජේයරත්න,
උ. ම. දි. පිස්කල්.

වර්ෂ 1960ක් වූ පෙබරවාරි මස 29 වන දින,
අනුරාධපුර පිස්කල් කන්තෝරුවේදීය.


5—ජේ. ඇන්. බී 22126—1,306 (2/60)

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරනු ලබන සංශෝධිත ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ **ප්‍රසිඬ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාද දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාද දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ නමක් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිඬ කරනු නො ලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා **1955 ජනවාරි 1 වැනි දින** සිට අය කරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. **සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.** ප්‍රසිඬ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම **පස්වරු 3.30ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30ට ප්‍රථමයෙන්).**

13. **ගැසට් පත්‍රය සඳහා දායක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.**

14. දායක මුදල් :—

| | | | රු. | ශ. |
|---|---|---|---|---|
| වාර්ෂික දායක මුදල ... ... | එක් කාණ්ඩයක් සඳහා ... | | 15 | 0 |
| | I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | | 7 | 0 |
| සෑම කාණ්ඩයකම එක් කොටසක පිට පතකට ... ... | ... ... | | | 25 |
| | තැපැල් ගාස්තුවත් සමග ... | | | 31 |
| I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | ... ... | | | 10 |
| | තැපැල් ගාස්තුවත් සමග ... | | | 14 |

15. පරණ ගැසට් කොපි තිබේ නම් ඒ සඳහා ගාස්තුව දෙගුණයක් වේ. මෙය **කොළඹ රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි තැනගෙන්** ඉල්ලුම් කළ යුතුයි.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.